සියලුම හිමිකම් ඇවිරිණි/முழுப் பதிப்புரிமையுடையது/All Rights Reserved

2024.02.08

බස්නාහිර පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
மேல் மாகாணக் கல்வித் திணைக்களம்
Department of Education - Western Province

# වර්ෂ අවසාන ඇගයීම - 2023 (2024)
# ஆண்டிறுதி மதிப்பீடு - 2023 (2024)
# Year End Evaluation - 2023 (2024)

ශ්‍රේණිය / தரம் / Grade: 08

විෂයය / பாடம் / Subject: භූගෝල විද්‍යාව

පත්‍රය / வினாத்தாள் / Paper: I, II

කාලය / காலம் / Time: පැය 2 කි.

නම / பெயர் / Name: .................................................

විභාග අංකය / சுட்டிலக்கம் / Index No. ...........................

- සැලකිය යුතුයි.
- I කොටසේ සියලු ම ප්‍රශ්නවලට පිළිතුරු මෙම පත්‍රයේ ම ලියන්න.

## I - කොටස

- අංක 1 සිට 5 දක්වා ප්‍රශ්න සඳහා නිවැරදි පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න.

1. සූර්යයාට ආසන්නවම පිහිටි ග්‍රහලෝකය වන්නේ
   i. අඟහරු ය ii. සිකුරු ය iii. බුධ ය iv. නෙප්චූන් ය
2. පෘථිවිය මත ජලයේ ව්‍යාප්තිය අනුව මිරිදිය ජලය පවතින ප්‍රමාණය ප්‍රතිශතයක් ලෙස කොපමණද?
   i. 0.5% ii. 1.75% iii. 1.25% iv. 97%
3. සෙනසුරු ග්‍රහලෝකය සම්බන්ධ නිවැරදි ප්‍රකාශය තෝරන්න.
   i. සූර්යයාගේ සිට දුර අනුව පස්වන ස්ථානයේ පිහිටයි
   ii. දර්ශනීය වළලු පද්ධතියකින් සමන්විතයි
   iii. උපග්‍රහයන් ගණන 14 කි
   iv. සෞරග්‍රහ මණ්ඩලයේ පළමු විශාලතම ග්‍රහලෝකයයි
4. නාසා ආයතනය පිහිටි රට කුමක්ද?
   i. ජපානය ii. ඇමෙරිකා එක්සත් ජනපදය iii. එංගලන්තය iv. රුසියාව
5. - හිම හා අයිස් ක්‍රමයෙන් දියවීම
   - අක්‍රියව පැවති ශාක දළුලා වැඩීම
   - මල් හා ඵල හට ගැනීම

   ඉහත සඳහන් ලක්ෂණ දක්නට ලැබෙන ඍතුව මින් කුමක්ද?
   i. ග්‍රීෂ්ම ii. සරත් iii. ශීත iv. වසන්ත

- ප්‍රශ්න අංක 6 සිට 10 තෙක්දී ඇති වාක්‍ය හරි නම් (✓) ලකුණ ද, වැරදිනම් (×)ලකුණ ද, ඉදිරියෙන් ඇති වරහන තුළ යොදන්න.

6. ලෝකයේ දෙවැනි විශාලතම සිනමා කර්මාන්තය පිහිටියේ මුම්බායි නගරයේය. ( )
7. උත්තර ධ්‍රැවය හා දක්ෂිණ ධ්‍රැවය සම්බන්ධ කරමින් නිර්මාණය කර ඇති මනඃකල්පිත රේඛා අක්ෂාංශ නමින් හඳුන්වයි. ( )
8. ආලෝකය හා ශක්තිය නිකුත් කරන සූර්යයා තාරකාවකි. ( )
9. පෘථිවිය පරිභ්‍රමණයේදී දේශාංශ $1^{\circ}$ක් ගමන් කිරීම සඳහා විනාඩි 4ක කාලයක් ගතවේ. ( )
10. ගංගානම් ගඟ පිහිටි රට පකිස්ථානයයි. ( )

- වරහන තුළ ඇති වචන උපයෝගී කරගෙන අංක 11 සිට 15 දක්වා ප්‍රශ්නවල හිස්තැන් පුරවන්න.
  (ශ්‍රී ලංකාව / 92 / 72 / වාරිමාර්ග / කඳුවැටි / මාලදිවයින / සාගර / මිරිදිය / සරත් / ගිම්හාන )

11. ශ්‍රී ලංකාවේ 1:50000 භූ ලක්ෂණ සිතියම කොටස් .............................. ට බෙදා තිබේ.

12. මිනිසා විසින් ගොඩනගන ලද .............................. සංස්කෘතික භූ දර්ශනයට අයත් වේ.

13. සංචාරක ව්‍යාපාරය ඉතා දියුණු රටක් ලෙස .............................. ප්‍රසිද්ධියක් උසුලයි.

14. පෘථිවිය මත ජල ව්‍යාප්තිය අනුව අඩුවෙන්ම පවතින්නේ .............................. ජලයයි.

15. උෂ්ණත්වය ක්‍රමයෙන් පහළයාම නිසා ශාකවල පත්‍ර හැලීම ආරම්භ වන්නේ .............................. සෘතුවේදී ය.

- අංක 16 සිට 20 දක්වා, 'අ' තීරුව සමග 'ආ' තීරුව නිවැරදිව ගලපා යා කරන්න.

| 'අ' | 'ආ' |
|---|---|
| 16. වෙරළබඩ භූ දර්ශනය | A – වී වගාව |
| 17. කඳුකර භූ දර්ශනය | B – හේන් වගාව |
| 18. නිම්න භූ දර්ශනය | C – සිප්පිකටු හා විසිතුරු භාණ්ඩ |
| 19. ග්‍රාමීය භූ දර්ශනය | D – ක්ෂේම භූමිවල වගා කිරීම |
| 20. කාන්තාර භූ දර්ශනය | E – බර උසුලාගෙන යාම |

(මුළු ලකුණු 2 x 20 = 40)

# භූගෝල විද්‍යාව 08

## II - කොටස

- පළමු ප්‍රශ්නය අනිවාර්යය වේ.
- තවත් ප්‍රශ්න හතරක් තෝරාගෙන පිළිතුරු සපයන්න.
- පිළිතුරු ලිවිය යුතු මුළු ප්‍රශ්න සංඛ්‍යාව පහකි.

---

1. අ. පහත රූප සටහන්වල දැක්වෙන භෞතික ලක්ෂණය කුමක්දැයි වරහන් තුළින් තෝරා A, B, C, D, E අනුපිළිවෙළින් ලියන්න.
(නිම්නය, නෙරුව, කඳුවැටිය, කපොල්ල, කොත්කන්ද)



A



B



C



D


E

ආ. ශ්‍රී ලංකාවේ 1:50000 හූ ලක්ෂණ සිතියම්වල දැක්වෙන සම්මත වර්ණ හා සංකේත භාවිත කරමින් පහත සඳහන් දෑ ඔබේ පිළිතුරුපත්‍රයේ ඇඳ දක්වන්න.

A -පාසල
B -රෝහල
C -ප්‍රධාන මාර්ගය
D -වැව
E -දුම්රිය මාර්ගය
(ලකුණු 10)

02. i. උප ග්‍රහයන් නොමැති ග්‍රහලෝක දෙකක් නම් කරන්න. (ලකුණු 02)
ii. වරහන තුළ දී ඇති ග්‍රහලෝක අතුරින් බාහිර ග්‍රහලෝක තුනක් තෝරා ලියන්න. (ලකුණු 03)
(බ්‍රහස්පති, සිකුරු, යුරේනස්, අඟහරු, පෘථිවි, සෙනසුරු)
iii. සෞරග්‍රහ මණ්ඩලය පිළිබඳ බැඳි පවතින විශ්වාස පිළිබඳ කෙටියෙන් විස්තර කරන්න. (ලකුණු 05)

03. i. පෘථිවිය භ්‍රමණය නිසා ඇතිවන ප්‍රධාන ප්‍රතිඵල දෙකක් ලියන්න. (ලකුණු 02)
ii. ලෝකයේ ප්‍රාදේශීය වශයෙන් සම්මත වේලාවන් කිහිපයක් භාවිතවන රටවල් තුනක් නම් කරන්න. (ලකුණු 03)
iii. පෘථිවිය මත ජීවය ඇතිවීමට හා එහි පැවැත්මට හේතුවී ඇති සුවිශේෂී ගුණාංග විස්තර කරන්න. (ලකුණු 05)

i. පෘථිවියේ ජලය පවතින ප්‍රධාන ආකාර දෙකක් ලියන්න. (ලකුණු 02)
ii. ජලයෙන් අපට ඇති ප්‍රයෝජන තුනක් ලියන්න. (ලකුණු 03)
iii. (a) වායුගෝලය දූෂණය වීමට බලපාන මානුෂ ක්‍රියාකාරකම් තුනක් ද,
(b) වායුගෝලයේ වැදගත්කම පිළිබඳ කරුණු දෙකක්ද ලියන්න. (ලකුණු 05)

05. i. දකුණු ආසියා කලාපයේ සාපේක්ෂ පිහිටීම අනුව
(a) උතුරින් පිහිටි කඳු පන්තිය සහ
(b) බටහිරින් පිහිටි මුහුද අනුපිළිවෙළින් ලියන්න. (ලකුණු 02)

ii. පහත සඳහන් අගනුවරවල් පිහිටි රටවල් a, b, c අනුපිළිවෙළින් නම් කරන්න.
(a) නවදිල්ලි
(b) ඩැකා
(c) ඉස්ලාමාබාද් (ලකුණු 03)

iii. දකුණු ආසියානු කලාපයේ නිම්න හූ දර්ශනය තුළ ජීවත්වන ජනතාවගේ ජීවනෝපාය මාර්ග සකස් වී ඇති ආකාරය කෙටියෙන් පැහැදිලි කරන්න. (ලකුණු 05)

06. i. දකුණු ආසියානු කලාපයේ වෙරළ තීරයක් නොමැති රටවල් දෙක නම් කරන්න. (ලකුණු

ii. වෙරළබඩ භූ දර්ශනයේ ධීවර කර්මාන්තය ආශ්‍රිත මානුෂ ක්‍රියාකාරකම් තුනක් ලියා දක්වන්න. (ලකුණු

iii. (a) වෙරළතීරයේ සංචාරක ආකර්ශණය ඇති වීමට හේතුවන සාධක තුනක් ද,

(b) වෙරළබඩ භූ දර්ශනය විනාශ වීමට බලපා ඇති අහිතකර මානුෂ ක්‍රියාකාරකම් දෙකක් ද සඳහන් කරන්න.

(ලකුණු

07. i. දකුණු ආසියානු කලාපයේ කාර්මික හා නාගරික භූ දර්ශනයට උදාහරණ වන නගර දෙකක් නම් කරන්න.

(ලකුණු

ii. කාර්මික හා නාගරික භූ දර්ශනය තුල පැන නැගී ඇති ගැටලු තුනක් ලියන්න. (ලකුණු

iii. කාන්තාර භූ දර්ශනයේ කැපීපෙනෙන ලක්ෂණ දෙකක් සඳහන් කර, ඔවුන්ගේ ජීවනෝපාය මාර්ග සකස් වී ඇ
ආකාරය විස්තර කරන්න. (ලකුණු